# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2022-10-17

පැමිණිලි පාර්ශවය : කේ. හේමමාලා මිය.
නො:72. රණගල මාවත,
බොරැල්ල , කොළඹ 08.

වගඋත්තර පාර්ශවය : 01. පො.ප.ජයරත්න මයා
පොලිස් ස්ථානය,
කුරුඳුවත්ත.

02. පො.ප. සිල්වා මයා
පොලිස් ස්ථානය,
කුරුඳුවත්ත.

03. උ.පො.ප.ශංකර් මයා
පොලිස් ස්ථානය,
කුරුඳුවත්ත.

<u>පැමිණිලි අංකය : **HRC/3534/15/1-23**</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමාට පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට කරන ලද දැනුම්දීමකට අනුව පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේ වගඋත්තර පාර්ශවය විසින් තමා නොකළ වරදක් සමබන්ධව නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරයට යොමු කිරිමට කටයුතු කිරීමත්, තමා විසින් පොලිස් ස්ථානයේ සිදු කළ පැමිණිල්ල සම්බන්ධව තමාට නීතිය නිසියාකාරව ක්‍රියාත්මක නොකිරීමත් හා

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com

කාන්තාවක් ලෙස තමාට අවමන් සහගත ලෙස සැළකීම හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලද බවයි.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

2015.10.08 දින පැය 21.00 ට තම පොලිස් ස්ථානයේ දුරකතන ක්‍රියාකරු විසින් රාත්‍රී ජංගම සංචාරයේ නිලධාරින්ට සමාජ ශාලාවේ සිදුවන පහරදීමක් සම්බන්ධව ලබා දුන් දුරකතන පණිවිඩය අනුව අදාළ ස්ථානයට ගොස් තුවාලකරු හා පහර දුන් පුද්ගලයන් ස්ථානයට රැගෙන ආ බවත්, එහිදී තුවාල ලැබූ තැනැත්තා රෝහල වෙත යාමට අවශ්‍ය බව දැන්වීම අනුව ඔහුගේ පැමිණිල්ල සටහන් කර අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් කළ බවත්, ඔහු එම අවස්ථාවේ රෝහල්ගත කළ බවත් 2015.10.11 වන දින රෝහලින් පිටව ගිය බවත් දක්වා ඇත.

මෙම පහර දුන් බවට පැවසූ අනෙක් පාර්ශවයද ඔවුන්ට ඉහත තුවාල ලැබූ පුද්ගලයා විසින් පහර දුන් බවට පැමිණිලි කිරීමට අවශ්‍ය බව දැන්වූ බවත්, එහිදී ඔවුන්ගේද පැමිණිලි සටහන් කර ඔවුන් වෙතද අධිකරණ වෛද්‍ය පෝරම නිකුත් කළ බවත්, ඔවුන් 2015.10.09 දින රාත්‍රී ජාතික රෝහල් බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබා ලෙන පිටව ගොස් ඇති බව අනාවරණය වූ බවත් දක්වා ඇත.

ඒ අනුව පොලිස් ස්ථානයේ මුල් පැමිණිල්ල කළ පුද්ගලයාට පහර දී තුවාල සිදු කිරීම සම්බන්ධයෙන් සහ ඔහු ඒ අවස්ථාවේ රෝහල් ගතවී ප්‍රතිකාර ලබා ගෙන, එදිනම මහේස්ත්‍රාත් නිල නිවසට බී 39767/01/15 යටතේ ඉදිරිපත් කිරීමෙන් පසු මහේස්ත්‍රාත්තුමාගේ නියෝග මත පොලිස් ඇප මත මුදා හැරිය බවත් ,පසුව තුවාලකරුට පහර දුන් අනෙක් වගඋත්තරකරුවන් වූ **දේශාන් දයානන්ද** 2015.10.28 දින අත්අඩංගුවට ගෙන ප්‍රකාශ සටහන් කොට පොලිස් ඇප මත මුදා හැරිය බවත් දක්වා ඇත.

පැමිණිලිකාරිය විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති පැමිණිලි වලට අදාළ වන අනෙක් පාර්ශවය 2015.10.22 දින පොලිස් ස්ථානය වෙත ගෙන්වා ප්‍රකාශ සටහන් කර මුදාහැර ඇති අතර, කොමිෂන් සභා විමර්ශනය අනුව එම පාර්ශවය සහ මෙම පැමිණිලිකාරිය අතර දීර්ඝකාලයක් තිස්සේ ඉඩම් සහ දේපළ ආරවුල් ඇති බවටද කරුණු ඉදිරිපත් වී ඇත. පහර දීම සිදුවූවායැයි දක්වන ස්ථානයේ සිටි පුද්ගලයන්ගේ සාක්ෂි සටහන් කළද, එම ප්‍රකාශ වලින් සිද්ධියක් වූ බවට අනාවරණය නොවූ බවත්, 2015.11.14 දින පසුව කළ අනෙක් පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශන අවසන් කර 2015.11.14 දින සමථ මණ්ඩලයට යොමුකළ බවත්, කොමිෂන් සභා පැමිණිලිකාරිය විසින් පොලිස් ස්ථානයේ සිදුකළ පැමිණිල්ල සම්බන්ධව සමථ මණ්ඩලයට යොමුකළ බවත් දක්වා ඇත.

**විමර්ශනය :-**

පැමිණිලිකාරිය පැමිණිල්ලේ මූලිකවම දක්වා ඇත්තේ, තමා අන්තනෝමතිකව අත්අඩංගුවට ගත් බවත්, තමා විසින් සිදු කළ පැමිණිල්ලට අදාළව නීතිය නිමයාකාරයෙන් ක්‍රියාත්මක නොකළ බවත්, තමා අවමන් සහගත ලෙස සැළකීමකට ලක් කළ බවත්ය.

පළමුව පැමිණිලිකාරිය අන්තනෝමතිකව අත්අඩංගුවට ගැනීම පිළිබඳ දක්වන පැමිණිල්ල සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදි පැමිණිලිකාරිය අත්අඩංගුවට ගනු ලබන්නේ 2015.10.10 ප.ව. 21.55 ට වන අතර ඊට පදනම් වන්නේ පැමිණිලිකාරිය සම්බන්ධව පොලිස් ස්ථානය වෙත 2015.10.08 දින CIB-1/80/53 යටතේ ගොනු කළ පැමිණිල්ලකට අදාළව බව නිරික්ෂණය වේ. එහිදි පහරදීමට අදාළව පොලිස් ස්ථානයට ලද දුරකථන ඇමතුමකට අනුව අදාළ පාර්ශවයන් පොලිස් ස්ථානයට ගෙන්වා සාක්ෂි හා පැමිණිලි සටහන් කිරිමෙන් අනතුරුව අත්අඩංගුවට ගෙන ඇති බවද පැහැදිලි වේ. ඒ අනුව ලද පැමිණිල්ලකට අනුව අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

මීළඟට පැමිණිලිකාරිය දක්වන තමා විසින් සිදු කළ 2015.10.08 වන CIB 86/55 පැමිණිල්ල විභාග නොකිරිම යන කාරණය පිළිබඳ අවධානය යොමු කිරිමේදි පැමිණිලිකාරිය විසින් පරුෂ වචනෙන් බැණ වැදි පහරදිමක් කිරිම පිළිබඳ CIB 86/55 යටතේ 2015.10.08 දින පැය 22.50 ට පැමිණිලි කර ඇති අතර, එසේම ඒ අවස්ථාවේදීම එම සිද්ධියට අදාළව CIB 83/54 යටතේ පැය 22.20 ට පැමිණිලිකාරියගේ පුතා වන පී.ඒ.තනූෂ නරේන්ද්‍ර විසින්ද පරුෂ වචනෙන් බැණ වැදි පහරදීමක් පිළිබඳ පැමිණිලි කර ඇති බවද නිරීක්ෂණය වේ.

එහිදි වගඋත්තර පාර්ශවය එම පැමිණිලි තුනටම අදාළව අධිකරණ වෛද්‍ය පෝරම නිකුත් කර ඇත. එසේම CIB 80/53 අදාළව සාක්ෂි සටහන් කර ඇති අතර, පසුව 2015.10.10 වන දින 80/53 ට පැමිණිල්ලට අදාළව පමණක් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන (CIB 583/54 හා 86/55 පැමිණිලිවල පැමිණිලිකරුවන්) මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කර පසුව එය සමථ මණ්ඩලයට යොමු කර ඇති බවද නිරික්ෂණය වේ.

පැමිණිලිකාරියගේ පුතාගේ පැමිණිල්ල හා මෙම පැමිණිලිකාරියගේ පැමිණිල්ල පිළිබඳවද ප්‍රකාශ සටහන් කොට 2015.10.22 දින අදාළ සැකකරුවන් ගෙන්වා ප්‍රකාශ සටහන් කොට (CIB 83/53 හි පැමිණිලිකරුව) ඔහු මුදා හැර 16/19703 යටතේ 2015.11.14 දින සමථ මණ්ඩලයට යොමු කර ඇති බවද නිරික්ෂණය වේ.

ඒ අනුව එකම සිද්ධියකට අදාළව ලද පැමිණිලි තුනකදී එක් පැමිණිල්ලක් සම්බන්ධව අප්‍රමාදව කටයුතු කිරීමක් හා අනෙක් පැමිණිලි කිරීමක් සම්බන්ධව පසුව ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් ඉහත කරුණු අනුව නිරීක්ෂණය වේ.

එසේම මෙම පැමිණිලි තුනම එකම සිද්ධියකට අදාළ වන බැවින් පැමිණිලි තුනම එකට විභාග කිරීමේ හැකියාව ඇති බවත්, එය සමථ මණ්ඩල පනත ප්‍රකාරව දෙවන උපලේඛනය යටතේ සමථ මණ්ඩලයට යොමු කළ හැකිව තිබූ බවත් නිරික්ෂණය වන අතර, CIB 80/53 පැමිණිල්ලේදී ලබාගත් සාක්ෂිවල පැමිණිලිකාරිය පහරදී ඇති බවට කිසිඳු සාක්ෂියකින් දක්වා නොතිබියදීත් අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කිරිමෙන් පසු නැවත සමථ මණ්ඩලයට යොමු කර ඇති බවද නිරික්ෂණය වේ.

ඒ අනුව සමථ මණ්ඩල පනතේ උපලේඛනය ප්‍රකාරව දණ්ඩ නීති සංග්‍රහයේ 319/316 වරදවල් සමථ මණ්ඩලය වෙත යොමු කිරීමේ හැකියාව තිබියදී එකම දින ලද පැමිණිලිවලින් CIB/80/53 පැමිණිල්ලට පමණක් ප්‍රමුඛස්ථානයක් දෙමින් කටයුතු කිරිම තුළින් වගඋත්තර පාර්ශවය පැමිණිලිකාරියට අසමානව සලකා ඇති බව නිරික්ෂණය වේ.

එසේම පැමිණිලිකාරියව වගඋත්තරකරුවන් විසින් අවමන් සහගත ලෙස සැළකිම පිළිබඳව අවධානය යොමු කිරිමේදි පැමිණිලිකාරිය තම පැමිණිල්ලේ අවමන් සහගත ලෙස සැලකූ බව වාචිකව දක්වා සිටියද 2015.12.01 දිනැතිව ඉදිරිපත් කළ දිවුරුම් ප්‍රකාශ මඟින්ද එම අවමන් සහගත සැළකීම් තහවුරු වීමට අදාළ කරුණු දක්වා නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලි පාර්ශවය විසින් එම කාරණා සනාථ කිරිමට ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර නොමැති හෙයින් පැමිණිලිකාරිය අවමන් සහගත සැළකීමට ලක් වූ බවට දක්වන කාරණය බැහැර කිරිමට සිදුවේ.

ඒ අනුව පැමිණිලිකාරිය විසින් කොමිෂන් සභාවට සිදු කරන ලද පැමිණිල්ලේ දැක්වූ කරුණු අනුව පැමිණිලිකාරිය වගඋත්තරකාර පොලිස් ස්ථානයට යොමු කළ පැමිණිලි වලට අසමානව සැළකීම යන කාරණය තහවුරු වීම මත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(2) වන ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති නීතියේ රැකවරණය නිසියාකාරව නොලැබීම යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(2) වන ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති

බැවින් පොලිස් ස්ථානයට ලද පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමේදී අප්‍රමාදව කටයුතු කිරීම හා එකම සිද්ධියට අදාළව ලද පැමිණිලි පිලිබඳ කටයුතු කරන ආකාරය හා සමථ මණ්ඩල පනත පිළිබඳවත් වගඋත්තර පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බවට පොලිස්පති වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 11 . 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂණ අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

03. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර.

B/